**ශීර්ෂය 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 27 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල හා පිරියත උපකරණ**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත පවරා දී ඇති රු.21,000,000 ක වටිනාකම වූ වාහන 03ක් 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හි 8.1 හා 8.2 ඡේද වල සඳහන් පරිදි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය මඟින් 2023 සැප්තැම්බර් 21 වන දින වාහන 3ක් පැවරීම සිදුකළද නිකුත් කිරීමේ නියෝග ඒවා ඇත්තේ 2024 ජනවාරි 31 දින දීය. එබැවින් එය පසුව ගිණුම් පොත් වල ඇතුළත් කරනු ලැබේ. | 2023 වර්ෂයේ මෙම වත්කම් ආයතනයේ නමට ලියාපදිංචි ඇති වි බැවින් ලේකම් කාර්යාලයේ අවසන් ගිණුම්වලට ගිණුම්ගත කළ යුතුවීම. |
| **(ii)** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/2023 හා 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 8.2 වගන්තිය ප්‍රකාරව රු.45,477,692 ක වටිනාකම් සහිත යාපනය දියත්මග ව්‍යාපෘතිය හා යාපනය උප කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | ලේකම් කාර්යාලය 2022 වර්ෂයේ සිට වෙනම වැය ශීර්ෂයක් යටතේ පවත්වාගෙන යනු ලබන අතර ස්ථාවර වත්කම් CIGAS වැඩසටහනට 2023 ජනවාරි 18 මාරු කරන ලදී. එසේ ඇතුළත් නොකරන ලද වත්කම් ඉදිරියේදී ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයන් හා මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් පිරිවැයට හෝ තක්සේරු අගයට ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වීම. |
| **(iii)** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/2023 හා 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 8.2 වගන්තිය ප්‍රකාරව සහ 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 හි 06 ඡේදයේ දක්වා ඇති ඇමුණුමෙහි 2.1 පරිදි ඉඩම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | ඉඩම් දෙකෙහි වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර වටිනාකම ලද පසු ගිණුම් වලට ඇතුලත් කළ හැකිවේ. | චක්‍රලේඛයන් හා මාර්ගෝපදේශ ප්‍රකාරව ඉඩම්වල වටිනාකම තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

(ආ) අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලේකම් කාර්යාලයේ අග්‍රිම ගිණුම් අංක 479/22 යටතේ 2022 දෙසැම්බර් 31 දිනට රු.39,670,090 ක අවසාන ශේෂයක් පැවති නමුත් 2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය අග්‍රිම ගිණුම් ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | අග්‍රිම ගිණුම් අංක 479/22 යටතේ 2022 දෙසැම්බර් 31 දිනට ඇති වූ වෙනස 2023 ජනවාරි හා අප්‍රේල් මාස වලදී භාණ්ඩාගාර මුද්‍රිත සටහන් මගින් ගලපා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.
<table>
<tr><th>ලේඛන වර්ගය</th><th>අදාළ රෙගුලාසිය</th><th>නිරීක්ෂණ</th></tr>
<tr><td>හානි පාඩු ලේඛනය</td><td>මු.රෙ. 110</td><td>යාවත්කාලීන කර නොතිබුණි.</td></tr>
<tr><td>නිවාඩු ලේඛනය</td><td>මු.රෙ. 190</td><td>යාවත්කාලීන කර නොතිබුණි.</td></tr>
<tr><td>වැය ලෙජරය</td><td>පොදු 138(A)</td><td>යාවත්කාලීන කර නොතිබුණි.</td></tr>
</table>
</td><td>ඉදිරියේදී හානි පාඩු ලේඛනය, නිවාඩු ලේඛනය හා වැය ලෙජරය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට නිලධාරීන් දැනුවත් කරන ලදී. 2023 වර්ෂයේ වැය ලේජරයේ ප්‍රතිපාදන ඉක්මවා නොමැති බව දන්වමි.</td><td>රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු ලේඛන යාවත්කාලීන කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.</td></tr>
</table>

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2023 සහ 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛයේ 02 (අ) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය වියදම් වඩා අරපිරිමැසුම් ලෙස භාවිත කිරීම හා අත්‍යාවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරීම සිදුකළ යුතු වුවද ලේකම් කාර්යාලය විසින් වැය විෂයයන් 17ක රු.3,684,000ක් ඉතිරිකිරීම් වෙනුවෙන් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි. | අමප/23/0624/628/022-I හා 2023.04.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මගින් වෙළඳ නාවික ලේකම් කාර්යාලය නව ගොඩනැගිල්ලක් වෙත ගෙන යෑමේ වියදම් 2023 වර්ෂයේ ප්‍රතිපාදනය තුළ කළමනාකරණය කර ගැනීමට අනුමැතිය ලබාදී තිබූ බැවින් ඉතිරි කිරීම් සිදු කිරීමට නොහැකි විය. | රාජ්‍ය වියදම් වඩා අරපිරිමැසුම් ලෙස භාවිත කිරීම සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ඉහත චක්‍රලේඛයේ ඇමුණුම් 01හි ඇති ආකෘතියට අනුකූලව 2023 පෙබරවාරි 28 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට විද්‍යුත් තැපැලෙන් ඉතිරි කිරීම් සම්බන්ධයෙන් තොරතුරු දැනුම්දිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අයවැය මඟින් වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත වෙන් කර ඇති සමස්ථ ප්‍රතිපාදනය තුළ කළමනාකරණය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/23/0624/628/022-I හා 2023.04.18 දිනැතිව අනුමැතිය ලබාදී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංශෝධිත වියදම් ඇස්තමේන්තු සකස් කර නියමිත දිනයට ඉදිරිපත් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |
| **(i)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ලේකම් කාර්යාලයේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි සැලකිල්ලෙන් කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 16 කට අදාළව එකතුව රු.29,970,000ක් වෙනත් වැය විෂයයන්ගෙන් හුවමාරු කරගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 5 ක් හා සියයට 500ක් අතර පරාසයක පැවතුණි. | 2023 වර්ෂයේ රට තුළ පැවති මූල්‍යමය දුෂ්කරතා හා නව ගොඩනැගිල්ලක් වෙත කාර්යාලය රැගෙන යාමට සිදුවීම නිසා ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමට නොහැකි විය. | මු.රෙ 50 හි සඳහන් ආකාරයට නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |
| **(ii)** | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු (1404) වැය විෂයය යටතේ මු.රෙ 66/69 යටතේ මාරු කර ගත් රු.1,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.428,399 ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එය මාරු කර ගත් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 42.83 ක් විය. | කුලියට ලබාගත් ගොඩනැගිල්ලේ සේවා කොන්දේසි නිසි අයුරින් ඉටු නොකිරීම නිසා 2023 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසික කුලිය ගෙවීම ප්‍රමාද කරන ලදී. | බදු කුලී සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගතයුතු අතර මු.රෙ 66/69 යටතේ මාරු කරගත් ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(iii)** | 2023 වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් මූලධන වැය විෂයයන් 02 ක රු.964,908 ක් ද, පුනරාවර්තන වැය විෂයයන් 04ක රු.138,160ක් වූ ද, එකතු කල වටිනාකම රු.1,103,068 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | අයවැය චක්‍රලේඛ 2/2023, 01/2023 හා 9/2022 අනුව වියදම් කිරීම සීමා කළයුතු බැවින් ඉහත වැය විෂයයන්වල ඉතිරිවීම් සිදුව ඇත. | මු.රෙ ප්‍රකාරව ලබාගත් ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** | ලේකම් කාර්යාලයේ අයවැය ඇස්තමේන්තුවෙන් අවස්ථා 15 කදී රු.5,734,480 ක අධිවැය දරා තිබූ අතර ඒවා ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි. | අධිවැය ලෙස සඳහන් කර ඇති වැය විෂයයන් සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කළ ද ප්‍රතිපාදන නොලැබීමෙන් ඉහත සඳහන් පරිදි අධිවැය දැරීමට සිදුවිය. | වියදම් කලමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විෂය අංක 336-1-1-0-1703 යටතේ රජයේ නිලධාරීන්ගේ භාෂා හැකියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් අයවැයෙන් රු.100,000 ක් ප්‍රතිපාදන වලින් රු.54,398 ක මුදලක් අරමුණින් පරිභාහිර කටයුතු වලට යොදවා තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත 336-2-1-0-1703 යටතේ ගෙවීම් සිදු කරන ලදී. ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොකිරීමට සටහන් කරගන්නා ලදී. | ප්‍රතිපාදන, අයවැය ගත ශේෂ සඳහා පමණක් වැයකිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ ගෙවිය යුතුව තිබූ රු.10,639,275ක් බැදීම් හා බැරකම් 2024 මාර්තු 25 වන විට පියවා තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,752,354ක් ලෙස රු.5,886,921ක් වැය විෂයයන් 10කට අදාළව අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගෙවා ඇති 2023 වර්ෂයට අදාලව ඇතැම් වියදම් සඳහා බිල්පත් ලැබී ඇත්තේ 2024 වර්ෂයේය. | කාලපරිච්ඡේදයේ බැදීම් හා බැරකම් නිසි පරිදි වාර්තාගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වෙළඳ නාවික ලේකම් කාර්යාල පැරණි ගොඩනැගිල්ල කඩා වැටීම හේතුවෙන් නව ගොඩනැගිල්ලක් වෙත කාර්යාලය ගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව වර්ෂයේ සමස්ත ප්‍රතිපාදනය තුළ වියදම් කලමනාකරණය කර ගත යුතු බවට තීරණය කර තිබුණි. එසේම මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් බැදීම් හා බැරකම් ඇතිකර ගත යුතු බව දක්වා තිබුණද උක්ත රෙගුලාසි නොසලකා අවස්ථා 11කදී රු. 9,938,532ක ප්‍රතිපාදන ඉක්මවා බැදීම් හා බැරකම් සඳහා එළඹ තිබුණි. | 2023 වර්ෂයේදී අනපේක්ෂිත ලෙස වෙළඳ නාවික ලේකම් කාර්යාල ගොඩනැගිල්ල කඩා වැටීම හේතුවෙන් වහාම නව කාර්යාල ගොඩනැගිල්ලක් වෙත යාමට සිදුවීමත් හා අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් වියදම් දැරීමට සිදුවිය. | මු.රේ 94 (1) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 1645 | වාහන ලොග් සටහන් පොත්වල (පොදු 267) මාසික සාරාංශ සහ අළුත්වැඩියා කිරීම පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අංක WPKR- 5439, WPPJ-8817 හා WPKS 2340 දරණ වාහන 2023.09.21 දින කාර්යාලය වෙත පවරා ගෙන එදින සිට ලොග් පොත්වල අදාළ තොරතුරු සටහන් කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ලොග් සටහන් පොත නිසියාකාරව යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදය | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2023 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සෑම වර්ෂයකදීම සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගැනීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍යපරිපාලන චක්‍රලේඛ අංක 30/2016 – 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර 25,000ක ධාවනය කිරීමෙන් පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි. | සංචිත වාහන දෙක සඳහා අදාළ ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට 2024 අප්‍රේල් 03 දින කමිටුවක් පත් කර ඇති අතර එහි කමිටු වාර්තාව ලද වහාම එවීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |
| (ii) | 3.3 ඡේදය | ඡේදයේ උපදෙස් පරිදි මාසික රාජකාරි සඳහා කරන ලද ප්‍රවාහන සේවා සටහනක් සකස් කර නොතිබුණි. | උපදෙස් පරිදි 2024 මැයි මස සිට ප්‍රවාහන සේවා සටහන් පත්‍ර නිසි පරිදි සටහන් කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රවාහන සේවා සටහන් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ඇමුණුම 02 | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නිලධාරින් සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018/(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මෙමගින් හඳුන්වාදී ඇති පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කරමින් ඇති බව කරුණාවෙන් දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම මෙහෙවර

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැක්ම මෙහෙවර හා අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය පරිදි මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line), ආදායම් ශීර්ෂයන් සඳහා අනුමත ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැසුම් හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ප්‍රතිඵල (Output/Outcome) හා ඇතුළත් විය යුතු වුවද ඒ අනුව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව හා වාර්ෂික අක්මුදල් සැලැස්ම ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම සඳහා අන්තර්ගත කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත විය යුතු වුවත් එම කරුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී තවදුරටත් යාවත්කාලීන කරමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය කටයුතු යොදමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඇතුලත් විය යුතු සියළු කරුණු ඇතුලත්ව විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

### 3.2 කාර්යභාරය ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව ප්‍රධාන කාර්යයන් 12 ක්, කෙටිකාලීන සැලසුම් 4 ක් හා දිගුකාලීන සැලසුම් 03ක් ඉදිරි සැලසුම් ලෙස දක්වා තිබුණද එම ප්‍රධාන කාර්යයන් හා සැලසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති වීම හේතුවෙන් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය පරික්ෂා කිරීමට නොහැකි විය. | කෙටුම්පත් වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇති ප්‍රධාන කාර්යයන් හා සැලසුම් ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ඇතුලත් ප්‍රධාන කාර්යයන් මෙන්ම දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් ඇතුලත් කර ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ඇතුළත් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

### 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ නාවික ලේකම් කාර්යාලය මඟින් කොළඹ 10 මරදාන පාරේ අංක 79 දරන ස්ථානයේ පිහිටි මහල් 6 ක ගොඩනැගිල්ල 2023 අගෝස්තු 01 දින සිට ඉදිරි වර්ෂ 05ක් සඳහා මාසිකව රු.1,697,400 ක මුදලකට බදු පදනමින් ලබා ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී ලංසු කැඳවා ගොඩනැගිල්ල බදු පදනම මත ලබා ගැනීමට කටයුතු කිරීම හා පිළිගත් තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කරවා ගැනීම සිදු කර නොතිබුණි. එසේම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එක් වසරක බදු කාලසීමාවකට යටත්ව ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව ගොඩනැගිල්ල වර්ෂ 5 ක කාලයක් සඳහා බදු පදනමට ලබාගෙන තිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ පවතින අනාරක්ෂිත බව නිසා අවම මිල ඉදිරිපත් කර තිබූ දැඩිගම ගෘහ ගොඩනැගිල්ල කුලියට ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසුව ගොඩනැගිල්ල කුලියට ගන්නා ලදී. | ලේකම් කාර්යාලය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 3.4 වත්කම් කලමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාපනය කයිට්ස්හි වෙළඳ නාවික ලේකම් උප කාර්යාලය, සංචාරක බංගලාව හා දියත්මග ව්‍යාපෘතියෙහි ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ රු.79,279,747ක් වැය කර තිබූ අතර එම ඉදිකිරීම් සිදු කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණු අතර 2022 හා 2023 වර්ෂයන් සඳහා රු.3,466,187ක් නඩත්තු වියදම්ද දරා තිබූ නමුත් වර්තමානයේදී එය නිශ්ක්‍රීය වත්කමක් බවට පත්ව තිබුණි. | අනපේක්ෂිත පරිදි 2020 වර්ෂයේ සුළි කුණාටුව හේතුවෙන් දියත්මග ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයෙන් විනාශ වූ අතර දියත් මග බාහිර පාර්ශවයකට කුලී පදනම මත බදු දීමට ඉදිරියේදී කටයුතු කරන බැවින් ඉදිරියේදී රජයේ ප්‍රතිපාදන මඟින් වියදම් දැරීමක් සිදු නොවනු ඇත. | විධිමත් ක්‍රියාපටිපාටියක් අනුව වත්කම් කුලී පදනම මත ගැනීමට ලේකම් කාර්යාලය විසින් කටයුතු කළ යුතු වීම. |

## 3.5 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.880 හා අංක 01/2020 හා 2020 අගෝස්තු 08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ii) කොටසෙහි 09 වගන්තිය ප්‍රකාරව ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු නිලධාරීන් 09 දෙනෙකු රු.147,500ක ඇප මුදල් තබා නොතිබුණි. | වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ නිලධාරීන්, රජයේ නිලධාරීන් සඳහා වූ ඇප ආඥා පනත යටතේ ඇප තැබීම සඳහා මේ වන විටත් කටයුතු සිදු කරමින් පවතී. | මු.රෙ. 880 සඳහන් ආකාරයට නියමිත ඇප තැබීම සිදුකිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාපනය දියත්මග ව්‍යාපෘතියේ (Slipway) ප්‍රධාන යන්ත්‍රයට 2020 වර්ෂයේදී ස්වාභාවිකව ඇති වූ බුරවි නම් සුළි කුණාටුව හේතුවෙන් රු.2,088,808ක හානියක් සිදුව තිබූ අතර එම අලාභ හානිය අවම කර ගැනීම සඳහා වගකීම් කාලයක් හා හානි පාඩු රක්ෂණාවරණයක් ලබා ගැනීමට කලමණාකාරීත්වය කටයුතු නොකිරීම නිසා සමස්ත අලාභයම රජයට දැරීමට සිදුව තිබුණි. එසේම මේ පිළිබඳ මු.රෙ.104 ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන ඒ අනුව කටයුතු කිරීමටද ප්‍රමාණවත් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමටද ක්‍රියාකර නොතිබුණි. | 2020 වර්ෂයේදී ස්වාභාවිකව ඇති වූ බුරවි නම් සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ අලාභයක් බැවින් පාඩු හා හානි ලෙස හඳුනා ගත නොහැකි බව දන්වමි. | මු.රෙ. 104 ප්‍රකාරව ඊට වගකිව යුත්තන් හඳුනාගෙන ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාපනය සංචාරක බංගලාව 2020 වර්ෂයේ සිට ඉල්ලුම්කරුවන් වෙත වෙන්කර දීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බැවින් එය නිශ්කාර්ය වත්කමක් බවට පත්ව තිබූ අතර රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | කඩිනමින් ව්‍යාපෘතිය බාහිර පාර්ශවයක් වෙත ලබා දීමට කටයුතු කරමි. | වත්කම් නිසි පරිදි කලමනාකරණය කර එය ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 4 යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර මු.රෙ. 133 (ආ) හා කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/01-2019 ප්‍රකාරව එම වගකීම අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මඟින්ද නිසි පරිදි ආවරණය වී නොතිබුණි. | වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විගණනය ද සිදු කරනු ලබයි. අමාත්‍යාංශ විගණන අංශය විසින්ම ලේකම් කාර්යාලය විගණනය කිරීම යෝග්‍ය බව අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | මු.රෙ.133 ප්‍රකාරව හා චක්‍රලේඛ ප්‍රකාරව නිසි අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.
<table>
<tr><th>සේවක වර්ගය</th><th>අනුමත සංඛ්‍යාව</th><th>තථ්‍ය සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ</td><td>25</td><td>10</td><td>15</td></tr>
<tr><td>තෘතීයික</td><td>04</td><td>01</td><td>03</td></tr>
<tr><td>ද්විතීයික</td><td>66</td><td>48</td><td>18</td></tr>
<tr><td>ප්‍රාථමික</td><td>30</td><td>14</td><td>16</td></tr>
<tr><td></td><td><u>125</u></td><td><u>73</u></td><td><u>52</u></td></tr>
</table>
ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාව සියයට 60ක්, හා ප්‍රාථමික මට්ටමේ සේවක සංඛ්‍යාව සියයට 53ක් පුරප්පාඩුව පැවතුණි.</td><td>නාවික ක්ෂේත්‍රයේ වෘත්තීයමය විධායක තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ අනුමැතිය ලබා ගෙන ජාතික පුවත්පත්වල දැන්වීම් පලකළද කිසිවෙකු ඒසඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි. තෘතියික, ද්විතීයික හා ප්‍රාථමික මට්ටම් වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා මේ වන විටත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිඛිතව සහ වාචිකව දැනුම් දී ඇත.</td><td>මානව සම්පත් ප්‍රශස්ත හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද කාර්ය පරිපාටික රීතිවල 34 ඡේදය හා 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද කාර්ය පරිපාටික රීතිවල 38 ඡේදය ප්‍රකාරව ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු තනතුරු 07කට අදාළව නිලධාරීන් 11ක් බඳවා ගැනීම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. | තනතුරු 4ක් සඳහා විධිමත් බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩල පත්වීමක් වේ. අනෙක් තනතුරු දෙක සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර අනුමත කරවා ගැනීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම. |